රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 197(vii)

මගේ අංකය: 543/703 බී.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ-7
1982 මැයි මස 31 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

වැටුප් සංශෝධන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම-
81.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
අංක. 197 ට සංශෝධන

01. 4 (viii) ඡේදය සම්බන්ධයෙන්, 81.12.31 දින වැටුපට "විවාහ දීමනාව ද" ඇතුළත් විය යුතුය. නිලධාරියාගේ විවාහක හෝ අවිවාහක භාවය ගැන නොසලකා සෑම අයකුටම "සමාකලිත වැටුප් පැකේජය" ගෙවිය යුතු අතර, කලත්‍රයින් දෙදෙනාම රජයේ නිලධාරීන් වේ නම් ඒ දෙදෙනාටම ද එය ගෙවිය යුතුය.

රජයේ නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ කලත්‍රයා රජයේ සංස්ථාවක සේවය කරයි නම් ඔහුට/ඇයට 1982.01.01 දින සිට "විවාහ දීමනාව" අදාළ වුව නම්, එය සම්පූර්ණයෙන්ම ලැබීමට හිමිකම් ඇත.

02. අංක. 147 හා 74.02.28 දිනැති ආයතන චක්‍රලේඛයේ 5:2 ඡේදය, 82.01.01 දින සිට අදාළ නොවේ. අංක. 197(iv) හා 82.03.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 ඡේදය මගින් සංශෝධනය කළ ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 197 හි iii පරිශිෂ්ටය ප්‍රකාර දෛනික වැටුප් ප්‍රමාණයන් ගණනය කළ යුතුය.

03. අංක. 197 (iii) හා 82.03.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය යටතේ වැඩි ලැබීමට සුදුසුකම් ඇති නිලධාරීන්ට, අංක. 197(v) හා 82.04.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 ඡේදය මගින් සැලසෙන වැඩි ලැබිය යුතු නොවේ.

04. 1982.12.29 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 197 හි iii වැනි පරිශිෂ්ටයෙහි දැක්වෙ සඳහන් වුව ද, පහළ හා ඉහළ ශ්‍රේණි දෙකෙහිම අනියම් ලිපිකරුවන්ගේ දෛනික වැටුප් ප්‍රමාණයන් 75.04.01 දින සිට රු. 12.75 ලෙස සංශෝධනය වී ඇති බැවින්, 82.01.01 දිනට පෙර බඳවාගෙන ඇති අනියම් ලිපිකරුවන්ට, 82.01.01 දින සිට, ඔවුන්ට සේවයට පැමිණි සෑම දිනකට රු. 35.00 ක් ගෙවිය යුතුය.

05. නියෝජ්‍ය ඇමතිවරයෙකු, රජයේ නිලධාරියෙකු නොවන මෝටර් රථ රියැදුරෙකු තම නිල රථයේ රාජකාරි සඳහා යොදවා ඇත්තේ නම්, ඔහුට 1982.01.01 දින සිට වැටුප් වර්ධක වලට හිමිකමක් නොමැති, ස්ථිර වැටුප වශයෙන් වාර්ෂිකව රු. 8580/= ක් ද, ඊට අමතරව ඒ ඒ මාසයට අදාළ 1981.11.18 දින හා අංක. 378 දරන ආයතන චක්‍රලේඛ ලිපිය ප්‍රකාර, ජීවන වියදම් දර්ශකයට සම්බන්ධිත ජීවන වියදම් දීමනාව ද ගෙවිය යුතු වේ.

/ 2 පිටුවට....

06. 82.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:6:1 වගන්තියේ රු.500/= සීමාව ද, 12:6:2 වගන්තියේ රු.350/= සීමාව ද, පිළිවෙලින් රු.1000/= (එක්දහස) හා රු.750/= (හත්සිය පණස) යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය පරිපාලන ලේකම්.